# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර

**ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අක්ෂි ශල්‍යකර්ම සඳහා ද විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ හා අධ්‍යාපනය සඳහා ද අවශ්‍ය කුණීත, කෘත්‍රිම උපාංග සහ අනෙකුත් පටක සැපයීම පිණිස ද; අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය කුණීත හා වෙනත් පටකවල අතිරික්තය වෙනත් රටවල් සමඟ බෙදා ගැනීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

සෞඛ්‍ය අමාත්‍යතුමා විසින්
2023 අගෝස්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 අප්‍රේල් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[193 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 36.00    තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර

එල්.ඩී.—ඕ. 49/2013

**ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; අක්ෂි ශල්‍යකර්ම සඳහා ද විද්‍යාත්මක සහ තාක්ෂණික පර්යේෂණ හා අධ්‍යාපනය සඳහා ද අවශ්‍ය කුණීත, කෘත්‍රිම උපාංග සහ අනෙකුත් පටක සැපයීම පිණිස ද; අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය කුණීත හා වෙනත් පටකවල අතිරික්තය වෙනත් රටවල් සමග බෙදා ගැනීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි**

පූර්විකාව

ආසියාව තුළ ඉහළ ව්‍යාප්තියක් සහිත කුණීතමය අන්ධභාවය, ලොව පුරා අන්ධභාවය සඳහා ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, කුණීතමය අන්ධභාවය තුරන් කිරීමේ අභිලාෂයෙන්, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වර්ෂ දෙදහස් එකොළහේ පෙබරවාරි මස විසිහතර වන දින සිට කොළඹ ජාතික අක්ෂි රෝහල තුළ ස්ථානගත කරනු ලැබූ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවක් ස්ථාපනය කරන ලද හෙයින් ද;

අන්ධභාවය තුරන් කරලීම සහ වළක්වා ගත හැකි අන්ධභාවය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ අදහසින් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව සංස්ථාපනය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ අභිලාෂය වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වන කොටස

### ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය පිහිටුවීම

ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය පිහිටුවීම

**2.** (1) (මෙහි මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එකී භාරය (1) වන උපවගන්තිය මගින් ඊට ලබා දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන්, එය විසින් හා ඊට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි වන්නේ ය.

භාරයේ පරමාර්ථ

**3.** භාරයේ පරමාර්ථ වන්නේ-

(අ) ශ්‍රී ලංකාවෙන් අන්ධභාවය තුරන් කරලීම සහ වැළැක්විය හැකි අන්ධභාවය වැළැක්වීම හා පාලනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික අක්ෂි පටක බැංකුව ලෙස කටයුතු කිරීම;

(ඇ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක ලබා ගැනීම සහ බද්ධ කිරීම සහ වෙනත් පටක පාවිච්චි කිරීමට අදාළ වන්නා වූ, නියෝග මගින් නියම කරනු ලැබිය යුතු වූ, වෛද්‍ය සහ ගුණාත්මක ප්‍රමිති සහ ආචාරධර්මවලට අනුගත වෙමින් අක්ෂි ශල්‍යකර්ම, පර්යේෂණ සහ අධ්‍යාපන කටයුතුවලට අවශ්‍ය කුණීත සහ වෙනත් පටක ලබා ගැනීම, පිරිසැකසුම් කිරීම සහ බෙදා හැරීම;

(ඈ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත හා වෙනත් පටක පරිත්‍යාගයේ ප්‍රතිලාභ සහ සාරධර්ම පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම;

(ඉ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක හා වෙනත් පටක ලබා ගැනීමට පටක සම්බන්ධීකරුවන් පුහුණු කිරීම;

(ඊ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත හා වෙනත් පටක බද්ධ කිරීම් සඳහා රජයේ රෝහල්වලට නොමිලේ සැපයීම; සහ

(උ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය කුණීත පටක හා වෙනත් පටකවල අතිරික්තය වෙනත් රටවලට ලබා දීම සහ ඒ සඳහා නියම කරනු ලැබිය හැකි පිරිසැකසුම් ගාස්තුවක් ඔවුන්ගෙන් අයකර ගැනීම.

## II වන කොටස

### ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර මණ්ඩලය පිහිටුවීම

**4.** භාරයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත භාර මණ්ඩලයක් වෙත පැවරිය යුතු ය:-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්, එනම්-

(i) (මෙහි මින්මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා;

(ii) කොළඹ ජාතික අක්ෂි රෝහලේ අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය අධක්ෂ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ අනුයෝජිතයකු;

(iii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ අනුයෝජිතයකු;

(iv) කොළඹ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධරයා; සහ

(v) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා;

(ආ) (මෙහි මින්මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන්:-

(i) 2000 අංක 12 දරන ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව විසින් නම් කරනු ලබන අනුයෝජිතයකු;

(ii) අක්ෂි වෛද්‍ය ක්ෂේත්‍රයේ සුදුසුකම් සහ ප්‍රවීණතාව සහිත (105 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා වෛද්‍ය ආඥා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයන් අතරින්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නම් කරනු ලබන වෛද්‍ය වෘත්තිකයකු; සහ

(iii) නීතිය හෝ කළමනාකරණ ක්ෂේත්‍රවල පළපුරුද්ද සහිත සහ හැකියාව පෙන්වා ඇති තැනැත්තකු.

පත් කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**5.** (1) සෑම පත් කළ සාමාජිකයකු ම, කලින් සිය ධුරය අත්හළහොත් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලයක් දක්වා ධුර දැරිය යුතු යඃ

එසේ වුව ද, මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධුරයක පුරප්පාඩුවක් පිරවීමට අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයකු, ඔහු විසින් කලින් ධුරය අත්හළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(2) ධුරය අත්හරිනු ලබන මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, 6 වන වගන්තිය යටතේ ඔහු ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, අනුගාමී හෝ එසේ නොවන තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

පත් කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**6.** (1) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු විසින්, ඕනෑම අවස්ථාවක, අමාත්‍යවරයා අමතා ඒ සම්බන්ධයෙන් යවනු ලබන ලිපියක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එකී ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පිළිගත් දින සිට බලාත්මක වන්නේ ය.

(2) අමාත්‍යවරයාට, යම් පත් කළ සාමාජිකයකු, ඒ සම්බන්ධයෙන් හේතු දක්වා, ඔහුගේ ධුරයෙන් ඉවත් කළ හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ යම් පත් කළ සාමාජිකයකු, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට හෝ වෙනත් යම් තරාතිරමකින් මණ්ඩලයේ සේවය කිරීමට සුදුස්සකු නොවිය යුතු ය.

(3) යම් පත් කළ සාමාජිකයකුගේ මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී, 4 වන වගන්තියේ (ආ) ඡේදයට යටත්ව, අමාත්‍යවරයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට, රෝගාතුර වීම හෝ වෙනත් යම් හේතුවක් මත හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, 4 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැළකිල්ලට ගනිමින්, එකී සාමාජිකයා නොමැති කාලය තුළ ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු, නොපැමිණීම සඳහා, සභාපතිවරයාගෙන් පූර්ව අනුමතයක් ලබා ගැනීමෙන් තොරව, මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනක් සඳහා සහභාගී වීමට අපොහොසත් වන්නේ නම්, එම තුන්වන රැස්වීම අවසානයේ දී, එකී සාමාජිකයා ස්වකීය ධුරය අත්හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, (3) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට, අමාත්‍යවරයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකයකු වීමට නුසුදුසුකම්

7. යම් තැනැත්තකු-

(අ) එම තැනැත්තා, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ආ) එම තැනැත්තා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභාවක සභිකයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ඇ) එම තැනැත්තාට, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සිය කර්තව්‍යය ඉටු කිරීමට අගතිගාමී ලෙස බලපෑමට ඉඩ ඇති යම් මූල්‍යමය හෝ වෙනත් බැඳියාවක් ඇත්නම්;

(ඈ) එම තැනැත්තා, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්වන යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම්;

(ඉ) එම තැනැත්තා, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද සිරදඬුවමක් විඳිමින් සිටින්නේ නම් හෝ එවැනි සිරදඬුවමක් විඳ ඇත්නම්,

ඔහු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරනු ලැබීම සඳහා නුසුදුස්සකු වන්නේ ය.

**මණ්ඩලයේ රැස්වීම්**

**8.** (1) මණ්ඩලයේ රැස්වීමකට සභාපතිවරයා පැමිණ සිටී නම්, ඔහු විසින් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය නියාමනය කළ හැකි ය.

(3) මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(4) ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක, සභාපතිවරයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

**සාමාජිකයන් අතර ඇති පුරප්පාඩුවක් හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා සහ කටයුතු අවලංගු නොවිය යුතු බව**

**9.** මණ්ඩලයේ සාමාජිකයන් අතර ඇති යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

**අමාත්‍යවරයා විසින් විශේෂ හෝ සාමාන්‍ය විධාන නිකුත් කළ හැකි බව**

**10.** මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට අදාළව අමාත්‍යවරයා විසින්, කලින් කල, විශේෂ හෝ සාමාන්‍ය විධාන මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධාන ක්‍රියාත්මක කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

## III වන කොටස

### මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය

මණ්ඩලයේ බලතල සහ කර්තව්‍ය

**11.** භාරයේ පරමාර්ථ සහ මේ පනතේ වෙනත් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන බලතල මණ්ඩලය සතු විය යුතු යː-

(අ) 22 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පටක සම්බන්ධීකරුවකු විසින් පරිත්‍යාගශීලීන් මිය ගිය විට එකතු කරනු ලබන ඔවුන්ගේ කුණීත පටක ලබාගැනීමට, පිරිසැකසුම් කිරීමට සහ බෙදා හැරීමට;

(ආ) අක්ෂි ශල්‍යකර්මවලට අවශ්‍ය වන්නා වූ කුණීත පටක සහ වෙනත් පටක නියම කරනු ලැබිය හැකි තත්ත්ව යටතේ ආරක්ෂිතව තබා ගැනීමට සහ ගබඩා කිරීමට;

(ඇ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විමසා, යම් අක්ෂි ශල්‍යකර්ම සිදු කිරීමට කටයුතු සැළසීමට;

(ඈ) 1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනතේ සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට යටත්ව, පරිත්‍යාගශීලීන් මිය ගිය විට, කුණීත පටක පරිත්‍යාග කිරීම සඳහා අනාගත පරිත්‍යාගශීලීන්ගේ ලිඛිත අනුමතය ලබා ගැනීමට;

(ඉ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය කුණීත පටක හෝ වෙනත් පටක මේ පනතේ කාර්යය සඳහා භාවිත කිරීම සඳහා නියෝග මගින් නියම කරනු ලැබිය යුතු වූ සුදුසු ප්‍රමිතියෙහි නොපවතින්නේ නම්, එම පටක ආපසු කැඳවනු ලැබීමට හෝ තත්ත්වයෙන් පහත හෙළනු ලැබීමට;

(ඊ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ යම් කුණීත හෝ වෙනත් පටක පරිත්‍යාගශීලීන්ගේ නාම ලේඛනයක් සහ දත්ත සමුදායක් සෞඛ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා තීරණය කරනු ලබන ආකාරයකින් පවත්වාගෙන යාමට;

(උ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක සහ වෙනත් පටක බද්ධ කිරීම සහ පිරිසැකසුම් කිරීම සම්බන්ධයෙන් වන පිරිවැය පියවා ගැනීම සඳහා ශ්‍රී ලාංකිකයන් නොවන්නන්ගෙන් අයකරනු ලැබිය යුතු ගාස්තු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීමට;

(ඌ) යම් විදේශීය රටක් වෙත මිත්‍රත්වය දැක්වීමේ ක්‍රියාවක් ලෙස අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය කුණීත පටක සහ වෙනත් පටක පිරිසැකසුම් කිරීමේ ගාස්තුවලින් තොරව ලබා දීමට අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කරනු ලබන විට දී, එසේ කිරීමට;

(එ) අක්ෂි බැංකුකරණය සම්බන්ධ විශේෂඥ ඥානය හෝ තාක්ෂණය වෙනත් රටවල් සමග බෙදාගැනීමට;

(ඒ) අදාළ ප්‍රමිති මත පදනම් වූ කුණීත පටක ලබාගැනීම සහ බද්ධ කිරීම පිළිබඳ ආචාරධර්ම සංග්‍රහයක් සකස් කිරීමට;

(ඔ) නිලධරයන් සහ සේවා නියුක්තයන් පත්කිරීමට, සේවයේ නියුක්ත කිරීමට හෝ සේවයෙන් පහ කිරීම හෝ එකී නිලධරයන් සහ සේවා නියුක්තයන්ගේ සේවය අවසන් කිරීමට සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සහ අදාළ වන ප්‍රතිපත්තිවලට අනුකූලව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව ඔවුන්ට යම් පාරිශ්‍රමික ගෙවීමට;

(ඕ) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව සඳහා ලාංඡනයක් සැලසුම් කිරීමට, පවත්වා ගැනීමට සහ භාවිතා කිරීමට;

(ක) ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවට සහාය වන හෝ එය ප්‍රතීතනය කරනු ලබන යම් ආයතනයක සංකේත, සලකුණු, ලකුණු හෝ අක්ෂර, අවශ්‍ය අවස්ථාවල දී, ලිපි ශීර්ෂ හෝ වෙනත් යම් ලේඛනයක භාවිත කිරීමට;

(ග) අමාත්‍යවරයාගේ එකඟත්වය මත, අක්ෂි බැංකුකරණය පිළිබඳ තත්ත්ව සහතිකකරණය සහ ක්‍රමවේද සංවර්ධනය

පිළිබඳව තැනැත්තන් පුහුණු කිරීම සඳහා තත්ත්ව සහතිකකරණය හා ක්‍රමවේද සංවර්ධනය හා සම්බන්ධ අක්ෂි බැංකුකරණයෙහි නියුතු රාජ්‍ය ආයතන විය යුතු විදේශ ආයතන හා සංස්ථාපිත මණ්ඩල සමග ගිවිසුම්වලට එළඹීමට;

(ච) ජාතික අක්ෂි බැංකුවේ නිලධරයන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පුහුණු කිරීමට, සහ වෙනත් රටවල අක්ෂි බැංකු නිලධරයන් අක්ෂි බැංකුකරණය සහ බද්ධකිරීම පිළිබඳ පුහුණු කිරීම හා එම පුහුණු කිරීම් සඳහා විදේශීය ජාතිකයන්ගෙන් අය කර ගනු ලැබිය හැකි ගාස්තු නිශ්චය කිරීමට;

(ජ) අක්ෂි ශල්‍යකර්ම සහ පටක පරිත්‍යාග කිරීම සහ එම ශල්‍යකර්ම සහ පරිත්‍යාග සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය හා සම්බන්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු හෝ වෙනත් වැඩසටහන් සංවිධානය කිරීමට;

(ට) භාරය සතු යම් චංචල හෝ නිශ්චල දේපළක් දැරීමට, බද්දට හෝ කුලියට ලබා ගැනීමට හෝ ලබා දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට හෝ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සහ භාරය සතු යම් ඉඩමක ගොඩනැගිලි ඉදි කිරීමට;

(ඩ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර මූලාශ්‍රවලින් ජාතික අක්ෂි බැංකු භාර අරමුදලට ලැබෙන්නා වූ චංචල සහ නිශ්චල ප්‍රදාන, ත්‍යාග සහ පරිත්‍යාග සහ රික්තවරණ ලබා ගැනීමට සහ පිළිගැනීමට සහ භාරයේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා ඒවා යොදා ගැනීමට:

එසේ වුව ද, භාරයට කරනු ලබන සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ණ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වූ යම් රාජ්‍ය බැංකුවක හෝ වෙනත් බැංකුවල, ජංගම, ඉතුරුම් හෝ වෙනත් තැන්පතු ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යෑමට සහ එම ගිණුම් වසා දැමීමට; සහ

(ත) පොදුවේ, මණ්ඩලයේ කර්තව්‍ය යථා පරිදි ඉටුකිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් ක්‍රියා සහ දේවල් කිරීමට.

දේපළ දැරීමට මණ්ඩලය සතු බලතල

**12.** යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් භාරය වෙත පවරනු ලැබිය හැකි චංචල හෝ නිශ්චල දේපළ ලබාගැනීමට සහ දැරීමට භාරයට නීතියෙන් හැකියාව තිබිය යුතු අතර, මේ පනතේ කාර්ය සඳහා එම සියලු දේපළ භාරය විසින් දරනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**13.** මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් ආකාරයකට මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

භාරයේ මුද්‍රාව

**14.** (1) භාරයේ මුද්‍රාව, මණ්ඩලය විසින්, කලින් කල, නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු අතර, එය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) භාරයේ මුද්‍රාව, මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහු නොසිටින අවස්ථාවක දී ඔහු විසින් ඒ සඳහා ලිඛිතව බලය පවරනු ලබන සාමාජිකයකු සහ මණ්ඩලයේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර නොතැබිය යුතු ය. එම සාමාජිකයන් දෙදෙනාම, තමන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධනපත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු අතර, එම අත්සන් තැබීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(3) මණ්ඩලය විසින්, එහි මුද්‍රාව තබනු ලබන සියලු සාධනපත්‍ර හෝ ලේඛන පිළිබඳ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

බලතල පැවරීම යනාදිය

**15.** (1) මණ්ඩලය විසින්, ලිඛිතව නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ එය සතු යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් මණ්ඩලයේ යම් සාමාජිකයකුට පැවරිය හැකි ය. එකී සාමාජිකයා විසින් එම බලතලය, කාර්යය හෝ කර්තව්‍ය, මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පැවරීමක් සිදු කළ ද, එය නොතකා, මණ්ඩලයට එසේ පවරන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

IV වන කොටස

**ජාතික අක්ෂි බැංකු භාර අරමුදල**

ජාතික අක්ෂි බැංකු භාර අරමුදල පිහිටුවීම

**16.** (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික අක්ෂි බැංකු භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදලේ කළමනාකරණය, පරිපාලනය, පාලනය සහ ක්‍රියාත්මක කිරීම මණ්ඩලය සතු විය යුතු ය.

(3) අරමුදලට-

(අ) ජාතික අක්ෂි බැංකුවේ ආරම්භක ප්‍රදානය සහ එහි වාර්ෂික ප්‍රදාන ද ඇතුළු භාරයේ පාවිච්චිය සඳහා පාර්ලිමේන්තුව විසින්, කලින් කල, වෙන් කරනු ලබන සියලු මුදල් ප්‍රමාණ;

(ආ) රැස් කළා වූ යම් අරමුදලක් හෝ ලැබුණා වූ යම් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග හෝ මේ පනතේ විධිවිධාන යටතේ ලබාගත් හෝ අයකරගත් මුදල්;

(ඇ) 30 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අරමුදලට මාරු කරන ලද මුදල් ප්‍රමාණ; සහ

(ඈ) ආයෝජනයකින් හෝ වෙනත් ලැබීම් මගින් භාරය වෙත ලැබිය යුතු යම් ආදායම්,

බැර කරනු ලැබිය යුතු ය.

(4) අරමුදලින්-

(අ) භාරයේ ක්‍රියාත්මක වීම සහ එහි නඩත්තුව සඳහා අවශ්‍ය වන්නා වූ සියලු වියදම්;

(ආ) භාරයේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන බවට මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවා වූ වෙනත් සියලු ගෙවීම්,

ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**17.** (1) භාරයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින්, භාරයේ ආදායම් හා වියදම් සහ අනෙකුත් සියලු මූල්‍ය ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(3) මණ්ඩලය විසින්, එක් එක් වසරේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට එහි ගිණුම් ශේෂ කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, ඊළඟ මාර්තු මස තිස් එක් වන දිනට පෙර, භාරයේ ආදායම් සහ වියදම් ගිණුමක් සහ පළමුව සඳහන් දිනය දක්වා වූ භාරයේ වත්කම් සහ වගකීම් පිළිබඳ සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රයක් පිළියෙල කිරීමට සැලැස්විය යුතු ය.

(4) ආදායම් සහ වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය ඒවාට අත්සන් තැබීම සඳහා මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයකින් බලයලත් මණ්ඩලයේ සාමාජිකයන් විසින් අත්සන් තබනු ලැබිය යුතු ය.

(5) භාරයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තාව

**18.** (1) භාරය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක් ඇතුළත, එකී වර්ෂය තුළ භාරය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවක්, භාරයේ වත්කම් හා බැරකම් ලැයිස්තුවක් ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, වාර්ෂික වාර්තාව ලැබීමෙන් මාස තුනක් ඇතුළත, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද ලේඛනය ද සමග එය පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු ය.

## V වන කොටස

### භාරයේ කාර්ය මණ්ඩලය

ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධරයා විය යුතු බව

**19.** (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා, භාරයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා විය යුතු යම් තැනැත්තෙක් භාරයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය යුතු ය. ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයාට මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට යටත්ව, ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයාට භාරයේ කටයුතු පරිපාලනය කිරීම, මණ්ඩලය විසින් ඔහුට පවරනු ලැබිය හැකි පරිදි වූ බලතල සහ කාර්ය, ක්‍රියාත්මක කිරීම හා කිරීම සහ භාරයේ සේවකයන් පරිපාලනය සහ පාලනය කිරීම බාර විය යුතු ය. ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා, මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු අතර, මණ්ඩලයේ ලේකම්වරයා ලෙස ද කටයුතු කළ යුතු ය.

(3) ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා විසින්, භාරයේ යම් සේවකයකුට, ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා වෙත මේ පනත මගින් පවරා ඇති හෝ පනවා ඇති යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, එසේ පැවරීම අවශ්‍ය යයි ඔහු සලකනු ලබන ඕනෑම අවස්ථාවක, මණ්ඩලයේ අනුමතය ඇතිව පවරනු ලැබිය හැකි අතර, එම සේවකයා විසින්, ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එකී බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය. මේ උපවගන්තිය යටතේ යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් එසේ පවරනු ලැබුව ද, එය නොතකා, එම බලතලය, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීමට ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයාට හැකි වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින්, හේතු දැක්වීමෙන් අනතුරුව, ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයාව ධුරයෙන් ඉවත් කළ හැකි අතර, (1) වන උපවගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගෙන ඒ වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා, සිය පත්වීමේ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර, (4) වන උපවගන්තිය යටතේ, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අනුගාමී හෝ එසේ නොවන, තවත් එක් ධුර කාලයකට නොවැඩි කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලබන්නේ ය.

(6) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ වෛද්‍ය අධ්‍යක්ෂවරයා ලෙස ධුර දරනු ලබන තැනැත්තා, (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට පළමු විධායක අධ්‍යක්ෂවරයා පත් කරනු ලබන තෙක් ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරනු ලැබිය යුතු ය.

**භාරයේ වෛද්‍ය අධ්‍යක්ෂවරයා**

**20.** අමාත්‍යවරයා විසින් සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා කුණීත පිළිබඳ අධිශිෂ්‍යත්වයක් ලබා ඇති හෝ බාහිර අක්ෂි රෝග, කුණීත ශල්‍යකර්ම, කුණීත හෝ බාහිර අක්ෂි රෝග පිළිබඳ පර්යේෂණ හෝ ඉගැන්වීම් පළපුරුද්ද සහිත හෝ කුණීත බද්ධ කිරීම් පිළිබඳ පළපුරුද්ද සහිත වූ විශේෂඥ අක්ෂි ශල්‍ය වෛද්‍යවරයකු, භාරයේ වෛද්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

**නිලධරයන් සහ සේවකයන් පත් කිරීම**

**21.** (1) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකුට, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත සහිතව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා භාරයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, භාරයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, භාරයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පටක සම්බන්ධීකාරකවරුන් පත් කිරීම

**22.** මේ පනතේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් රීති මගින් තීරණය කරනු ලැබිය යුතු සුදුසුකම්, බලතල සහ කර්තව්‍ය සහිත පටක සම්බන්ධීකාරකවරුන් අවශ්‍ය විය හැකි පරිදි වූ යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

භාරයේ නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**23.** භාරයේ සියලු නිලධරයන් සහ සේවකයන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධාන මත ගනු ලැබූ ක්‍රියා සඳහා ආරක්ෂාව

**24.** (1) භාරය විසින් හෝ ඊට එරෙහිව හෝ යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය විසින් දරන ලද යම් වියදමක්, භාරයේ අරමුදලින් පියවනු ලැබිය යුතු අතර, එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය වෙත ගෙවන ලද හෝ එය විසින් අය කරගනු ලැබූ යම් ගාස්තු, භාරයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) භාරයේ යම් සාමාජිකයකු, යම් නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද හෝ කරන ලද බවට උද්දේශික යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට එරෙහිව යම් අධිකරණයක පවරනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එම සාමාජිකයා, නිලධරයා, සේවකයා හෝ නියෝජිතයා විසින් එම ක්‍රියාව සද්භාවයෙන් සිදු කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, එහි දී ඔහු විසින් දරනු ලබන යම් වියදමක් වේ නම්, එම වියදම එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලැබුවහොත් මිස, භාරයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

භාරය, අල්ලස් පනතේ කාර්ය සඳහා උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව

**25.** අල්ලස් පනතේ අර්ථානුකූලව භාරය, උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

## VI වන කොටස

### වැරදි සහ දණ්ඩන

මේ පනත උල්ලංඝනය කරමින් කුණිත පටක ආදිය විකිණීමක්, ගනුදෙනු කිරීමක් හෝ බැහැර කිරීමක් සිදු කිරීම වරදක් වන බව

**26.** (1) කිසිම තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින්, අගනා ප්‍රතිෂ්ඨාවකට, අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණිත පටක හෝ වෙනත් යම් පටක මිලදී ගැනීම, විකිණීම, බැහැර කිරීම හෝ අන්‍යාකාරයකින් ගනුදෙනු කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක සිරදඬුවමකට හෝ එම දඩය සහ සිරදඬුවම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

## VII වන කොටස

### විවිධ

නියෝග

**27.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට සඳහන් හෝ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් නියෝග සාදනු ලැබිය යුතු බවට හෝ ඒ සඳහා බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සෑදීමට හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විමසා පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණිත පටක හා වෙනත් පටක එකතු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය;

(ආ) අක්ෂි ශල්‍යකර්ම කිරීමේ කාර්යය සඳහා ලබා ගැනීමට යෝග්‍ය වන සහ ඒ සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක හා වෙනත් පටකවල ගුණාත්මකභාවය;

(ඇ) කුණීත පටක ලබා ගැනීමේ දී හා බද්ධ කිරීමේ දී යොදා ගත යුතු වෛද්‍ය හා ගුණාත්මක ප්‍රමිති සඳහා ක්‍රියා පටිපාටි;

(ඈ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක හා වෙනත් පටක බද්ධ කිරීමේ හා පිරිසැකසුම් කිරීමේ පිරිවැය ආවරණය කර ගැනීමට ශ්‍රී ලාංකික ජාතිකයන් නොවන තැනැත්තන්ගෙන් අය කළ යුතු ගාස්තු; සහ

(ඉ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත හා වෙනත් පටක වෙනත් රටවල් සමග බෙදා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයේ සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් තුළ දී අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සැළකිය යුතු ය.

(5) නියෝගයක් පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**28.** (1) මේ පනත මගින් රීති සාදනු ලැබිය යුතු බවට සඳහන් හෝ ඒ සඳහා බලය දී ඇති සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලයට රීති සෑදිය හැකි ය. රීති

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, විශේෂයෙන්, පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් මණ්ඩලයට රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) පටක සම්බන්ධීකරුවන්ගේ සුදුසුකම්, බලතල සහ කර්තව්‍ය නිශ්චය කිරීම;

(ආ) අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක හා වෙනත් පටක ශ්‍රී ලාංකිකයන්ට ලබා දීමේ ක්‍රියා පටිපාටිය නිශ්චය කිරීම;

(ඇ) පටක සම්බන්ධීකරුවන් බඳවා ගැනීමේ සහ පුහුණු කිරීමේ ක්‍රියා පටිපාටිය නිශ්චය කිරීම; සහ

(ඈ) මේ පනත යටතේ තබා ගත යුතු සහ පවත්වාගත යුතු නාමලේඛන පවත්වා ගෙන යාම.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම අවශ්‍ය විට දී සංශෝධනය හෝ පරිච්ඡින්න කළ හැකි ය.

1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත අදාළ වීම

**29.** 1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනතේ 3, 4, 5, 6, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17 සහ 18 වන වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ භාවිත කරනු ලබන පටක සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඉතිරි කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන

**30.** (1) 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ බැරට පවතින්නා වූ සියලු මුදල් ප්‍රමාණයන් මෙම අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන්නා වූ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ නිලධරයන් සහ සේවකයන් ඔවුන්ගේ කැමැත්ත සහ මණ්ඩලයේ කැමැත්ත සහිතව, භාරයේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කැමැත්ත පළ කළ සියලු නිලධරයන් සහ සේවකයන් අදාළ ප්‍රතිපත්තියට අනුකූලව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සකස් කරන ලද බඳවා ගැනීමේ පටිපාටියේ නියමවලට යටත්ව සහ මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම ඔවුනට අදාළ වූ නියමවලට වඩා අවාසිදායක නොවන කොන්දේසි මත බඳවාගනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**31.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 හෝ 44 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පටක" යන්නට, 1987 අංක 48 දරන මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත යටතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"පටක සම්බන්ධීකාරක" යන්නෙන්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ හෝ ශ්‍රී ලංකා හෙද සභාව යටතේ ලියාපදිංචි වී ඇති සහ පටක වෙන් කර ලබා ගැනීම, උපදේශනය සහ පටක සම්බන්ධීකරණය සිදු කරනු ලබන අක්ෂි බැංකුවේ යම් හෙද නිලධරයකු අදහස් වේ.

අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**32.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.